**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සහ එහි පරිපාලිතය - 2022**

**-------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ( "කාර්යාංශය") සහ එහි පරිපාලිතයෙහි ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ හා සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ හා සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කාර්යාංශය හා සමූහය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවල මෙහෙයුම් පිරිවැය යටතේ දක්වා තිබුණු වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් යටතේ දක්වා තිබුණි. එහිදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 55 ඡේදය ප්‍රකාරව සංසන්දනාත්මක අගයන් යළි වර්ගීකරණය කිරීමට හේතුව හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි, 55 ඡේදය ප්‍රකාරව එහි සංසන්දනාත්මක අගයන් සටහන් අංක 21 ඒ, 21 බී, 21 සී සහ 22 හි පෙන්වා දී ඇත. | සන්සන්දනාත්මක අගයන් යළි වර්ගීකරණයට හේතුව හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 හි 54 ඡේදය ප්‍රකාරව රු.10,195,572 ක් වූ පූර්ව කාලපරිච්ඡේද ගැලපුම් මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව අනාවරණය කර නොතිබුණි. | ඉදිරියේදී පූර්ව කාල පරිච්ඡේද ගැලපුම් අනාවරණය කිරීමට කටයුතු කරනු ඇත. | පූර්වකාල පරිච්ඡේද ගැළපුම් අනාවරණය කළ යුතුය. |
| (ඇ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු පිරිවැය රු.749,442,316 ක් වූ සමූහයේ ස්ථාවර වත්කම් අයිතම 4,222 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 42 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ප්‍රමාණාත්මක අගයන්ගෙන් යුත් වත්කම් ප්‍රත්‍යාගණනයේදී, වර්තමානයේ රටතුළ පවතින වෙළඳපල අගයන් තුළින් පිළිබිඹු වන වටිනාකම්, පිරිවැය සමග සැසඳීමේ දී අසාමාන්‍ය අගයක් ගනී. එවැනි අගයන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමෙන් මූල්‍ය ප්‍රකාශන වල සත්‍ය තත්වය පිළිබිඹු නොවේ. | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි 39(අ) ඡේදය ප්‍රකාරව, | රාජ්‍ය භාග ආදායම උපචිත පදනම මත ගිණුම් ගත | ආදායම් ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය |

| | | | |
|---|---|---|---|
| | රාජ්‍යභාග ආදායම හඳුනා ගැනීම සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | කරනු ලබයි. | මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි 34 ඡේදය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි. | සම්බන්ධිත පාර්ශව වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | සම්බන්ධිත පාර්ශව වෙත සිදුකරන ගෙවීම් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 15 හි 14 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැය ලේඛනයේ වටිනාකම් සහ සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් ඇතුළත් කර හෝ අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කර නොතිබුණි. | අයවැය ලේඛනය සහ සත්‍ය වටිනාකම් මාසිකව අමාත්‍යාංශයේ පැවැත්වෙන කළමණාකරණ මණ්ඩලයට හා කාර්යාංශයේ කළමණාකරණ මණ්ඩලයට ඔවුන්ගේ අවධානයට හා උපදෙස් ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. | අයවැයගත අගයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිටකෝට්ටේ කාර්යාංශ පරිශ්‍රයේ නව විද්‍යාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2022 ජූලි 28 දින අවසන්ව මේ වන විට ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද ඊට අදාළ රු.408,858,451ක් වූ පිරිවැය කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය රු.8,466,636 කින් අඩුවෙන් දක්වා තිබුණි. | කාර්යාංශයේ ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවීම මත නව විද්‍යාගාර ගොඩනැගිල්ල භාවිතයට ගනිමින් පැවතුනද ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු අවසන්කර නොමැති බැවින් නිමා වීමෙන් පසුව ලබාදිය යුතු සහතිකය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මෙතෙක් ලබාදී නොමැත. එම නිසා මෙම වත්කම කාර්යාංශයේ වත්කමක් වශයෙන් සඳහන් කර නොමැත. | විද්‍යාගාර ගොඩනැගිල්ල නියමිත පරිදි ගිණුම්ගත කළ යුතු අතර කාලපරිච්ඡේදයට අදාළ ක්ෂය කිරීම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.1,309,812 ක් වූ ප්‍රවාහන, සංග්‍රහ, ගමන් වියදම් ද, පරීක්ෂණ ගාස්තු යන පුනරාවර්තන වියදම් ද කාර්යාංශයේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සඳහා ගෙවන ලද උපදේශන ගාස්තු රු.210,000 ක් ද කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ ඉන්ධන ටැංකිය ස්ථාපිත කිරීමට වැය කරන ලද එකතුව රු.1,500,256 ක් ද නව විද්‍යාගාර ගොඩනැගිල්ලට අදාළ කෙරීගෙන යන වැඩ ගිණුමට ඇතුළත් කිරීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ වැඩියෙන් සහ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | එම ගිණුමට රු.44,619 ක සංග්‍රහ වියදම් සහ ප්‍රවාහන වියදම් ඇතුළත් කර ඇත. එම මුදල එම ගිණුමෙන් ඉවත් කිරීමට හා ප්‍රාග්ධන වියදම් නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | පුනරාවර්තන වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත් කළ යුතුය. ඉන්ධන ටැංකිය ස්ථාපිත කිරීමේ වියදම යන්ත්‍රෝපකරණ ගිණුමට මාරු කළ යුතුය. |
| (ඇ) | ගොඩනැගිලි ද්‍රව්‍ය හා කාර්මික ඛනිජ සඳහා වූ රාජ්‍යභාග නියමිත පරිදි නොගෙවීමට අදාළ දණ්ඩන මුදල් පිළිවෙලින් රු.15,768,351 ක් හා රු.970,482 ක් සදොස් ලෙස රාජ්‍යභාග ආදායම් ලෙස දක්වා තිබුණි. | කැනීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය ඉදිරියේදී නිවැරදි කිරීමට සහ රාජ්‍යභාග මුදල් හා දඩ මුදල් වෙනම ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි. | රාජ්‍යභාග ආදායම හා දණ්ඩන වෙන වෙනම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | බැංකුවට සෘජු බැර කිරීම් රු.2,239,912 ක් හඳුනා ගැනීමට කටයුතු නොකර ගෙවිය යුතු ගිණුමකට මාරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණි. | බලපත්‍ර ලබාගැනීම උදෙසා සෘජු බැංකු තැම්පතු වශයෙන් රු.2,239,912 ක මුදලක් සේවාලාභීන් කාර්යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර ඇත. නමුත් මෙම සේවාලාභීන් බලපත්‍ර ලබාගැනීම සම්බන්ධව ඉදිරි පියවර සම්පූර්ණ කර නොමැත. | සෘජු බැර කිරීම් නොපමාව හඳුනා ගැනීමට හා අදාළ පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| වෙනත් ගෙවිය යුතු අත්තිකාරම් යටතේ දක්වා තිබුණු ප්‍රවාහන, කැණීම් හා ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලබා ගත් අත්තිකාරම්. | 211,368,988 | විස්තරාත්මක උපලේඛනය හා කාල විශ්ලේෂණය | විස්තරාත්මක උපලේඛනයක් හෝ කාල විශ්ලේෂණයක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාංශයේ පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගම විසින් කාර්යාංශයට ගෙවිය යුතු හා කාර්යාංශයෙන් සමාගමට ලැබිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.44,351,804 ක් හා රු.1,545,522 ක් විය. කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයට පරිපාලිත සමාගමෙන් ලැබිය යුතු හා කාර්යාංශයෙන් සමාගමට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.71,711,804 ක් හා 9,142,975 ක් විය. ඒ අනුව පිළිවෙලින් රු.27,360,000 ක හා රු.7,597,453 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | කාර්යාංශයේ පරිපාලිත සමාගම සහ කාර්යාංශය අතර, අන්තර් ගනුදෙනු සම්බන්ධයෙන් පැනනැගී ඇති වියදම් හා ආදායම් නිසි ලෙස නිරවුල් කර ඇති අතර, පරිපාලිත සමාගම විසින් ඉල්ලුම් කර ඇති රු.27,360,000 සඳහා ලිඛිත අනුමැතීන් නොමැති වීම නිසා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට කළමණාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මෙය ඉදිරියේදී නිරවුල් කරනු ඇත. | අන්තර් ආයතන ගනුදෙනු අතර පවතින වෙනස්කම් සසඳා නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට සැපයුම්කාර ආයතන 23 ක් වෙත රු.2,764,918 ක මිලදී ගැනීම් අත්තිකාරම් ගෙවා තිබුණු අතර එම වටිනාකම තුළ 2015 - 2020 කාලපරිච්ඡේදය තුළ ගෙවා තිබුණු අත්තිකාරම් රු.1,074,490 ක් ද විය. ප්‍රසම්පාදනයන් නිමකර එම අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කර | භාණ්ඩ මිල දී ගැනීම හා සේවා ලබා ගැනීම වෙනුවෙන් ආයතන 23 ක් වෙත ගෙවා තිබූ අත්තිකාරම් අතුරින් ආයතන කිහිපයක අත්තිකාරම් මේ වන විට නිරවුල් කර ඇත. ඉතිරි අත්තිකාරම් ගෙවීම්ද ඉදිරි මාස දෙක තුළ සොයා බලා | මිලදී ගැනීම් අත්තිකාරම් නොපමාව නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | නිරවුල් කිරීමට පියවර ගනු ඇත. | |
| (ඇ) | ණය හිමි හා ගෙවිය යුතු වටිනාකම් යටතේ දක්වා තිබුණු එකතුව රු.38,533,958 ක් වූ සේවයේ නියුක්ත නොවූ සේවකයන් 171 දෙනෙකු වෙනුවෙන් වෙන් කළ උපචිත දිරිදීමනා සහ 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය තෙක් දිරි දීමනා සඳහා අධි වෙන්කිරීම්, ශේෂ නිරවුල් කර නොතිබුණි. | කාර්යාංශයේ සේවයෙන් ඉවත් වූ හෝ මියගිය සේවකයින් හෝ විනය පරීක්ෂණවලට ලක්වූ සේවකයින් වෙනුවෙන් වෙන්කළ මෙම දිරිදීමනා සම්බන්ධව කාර්යාංශයේ කළමණාකරන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර, 2023 වර්ෂයේදී අදාල නිවැරදි කිරීම් සිදුකරනු ඇත. | ගෙවිය යුතු දිරිදීමනා සඳහා හිමිකම් නොපාන්නේනම් එම ශේෂ අහෝසි කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත | | | |
| | (i) 12(ආ) වගන්තිය | ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනා ගැනීම සහ ඒවා තක්සේරු කිරීම සිදුකර නොතිබුණි. | ඛණිජ පිහිටි ස්ථාන සිතියම්ගත කිරීම කාර්යාංශය මගින් නොකඩවා සිදුකරන අතර පළාත්බද ඛණිජ සිතියම් සකස් කර එය කාර්යාංශයේ පුස්තකාලයෙන් මිලදී ගැනීම සඳහා කටයුතු සලසා ඇත. ඛණිජ තක්සේරු කිරීම සඳහා විදුම් කටයුතු ආදිය සිදුකළයුතු බැවින් එයට ඉතා විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. නමුත් ඉතා වැදගත් ඇපටයිට් වැනි නිධි වල තක්සේරු කාර්යාංශය මගින් සිදුකර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව ඛනිජ සම්පත් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම කාර්යාංශය විසින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 12(ඉ) වගන්තිය | ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර කාර්යාංශය විසින් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් කැණීම් කරනු ලබන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා ඛනිජ සඳහා අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස අපනයනය කෙරෙමින් පැවතුණි. | තවදුරටත් රජයේ අනුග්‍රහය සහිතව ලංකා ඛනිජ වැලි සංස්ථාව මගින් පමණක් ඛනිජ වැලි අමුද්‍රව්‍ය ලෙස අපනයනය කරනු ලබයි. අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය සඳහා අගය එකතු කිරීමේ නිර්ණායක හඳුන්වා දී ඇත. | ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර කාර්යාංශය විසින් හඳුන්වාදිය යුතුය. |
| (iii) 28(1) වගන්තිය | කළුගල් සඳහා ප්‍රවාහන බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | කළුගල් ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීමෙන් කළුගල් වල වෙළඳපොළ මිල සීඝ්‍රයෙන් ඉහළ යනු ඇත. තවද ඒ සඳහා සේවකයන් යෙදවීම ප්‍රවාහන බලපත්‍ර පරීක්ෂා කිරීම් වැනි අමතර පරිපාලන වියදම්ද කාර්යංශයට දැරීමට සිදුවේ. | කළුගල් ප්‍රවාහන බලපත්‍රයක් හඳුන්වා දීමට හෝ පනත සංශෝධනයට පියවර ගත යුතුය. |
| (iv) 44(ඇ) වගන්තිය | පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් අවසර දී ඇති ගවේෂණ කටයුතු අධීක්ෂණය කිරීමේ සහ ඒ කටයුතු පවත්වා ගෙන යාම පිළිබඳව බලපත්‍රලාභියාට විධාන කිරීමේ බලය අධිකාරියට පැවරී තිබුණද, එයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී කාර්යාංශය විසින් ගාස්තු පදනම මත බලපත්‍රලාභීන් 3 දෙනෙකු වෙනුවෙන් ගවේෂණ කටයුතු සඳහා අවශ්‍ය කාර්යයන් රු.4,632,689 කට ඉටුකර දී තිබුණි. | කාර්යංශය මගින් භූ විද්‍යාත්මක සේවාවන් කරගෙන යනු ලබයි. ඒ තුළින් කාර්යාංශයට අමතර ආදායමක් ලබා ගැනීම හා භූ විද්‍යාත්මක දත්ත නිසි ප්‍රමිතියකින් ලබා ගැනීම එහි අරමුණ වේ. ආයතනය මගින් සිදුකරනු ලබන්නේ ගවේෂණ බලපත්‍රලාභියා එහි ඉදිරිපත් කර ඇති ගවේෂණ ක්‍රියාදාමයේ කෘත්‍ය සිදුකරන ක්‍රියාකාරකම් වලින් යම් කොටසක් පමණි. | ඛනිජ ගවේෂණ කටයුතු සම්බන්ධ නියාමන ආයතනය වශයෙන් එම කටයුතුවලට සම්බන්ධවීම සිදු නොකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (v) 52(2) වගන්තිය | කැණීම්වලින් අනතුරුව කැණීම් භූමි පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතු වුවද බලපත්‍රලාභීන් ලවා එම කාර්ය ඉටුකරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුනරුත්ථාපනය කිරිමට බලපත්‍රලාභීන් කටයුතු නොකරන්නේ නම් ඔවුන්ට විරුද්ධව නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. එහිදී බලපත්‍රලාභීන් තබා ඇති බැංකු බැඳුම්කර අධිකරණ නියෝග මගින් කාර්යාංශයට ලබා ගැනීමට (නැවත නිදහස් නොකරන මුදලක් ලෙස) 236/04/2023 දරන චක්‍රලේඛය මගින් ප්‍රතිපාදන සලසා ඇත. | කැණීම් භූමි පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 ඔක්තෝබර් 06 දිනැති අංක 21/1799/301/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සකස් කරන ලද ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිත කරන ඛනිජ කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහය | භූ විද්‍යා අංශය විසින් නිෂ්කාශන අනවශ්‍ය හෝ අවම ප්‍රමාණයක් කැඳවීමට සිදුවන කැණීම් ස්ථාන, නිෂ්කාශන කිහිපයක් කැඳවීමට සිදුවන ස්ථාන, නිෂ්කාශන රාශියක් කැඳවීමට සිදුවන කැණීම් ස්ථාන ප්‍රමුඛතා 1, 2, 3 ලෙස වර්ගීකරණය කර ඒ යටතේ ලේඛන පවත්වාගෙන යාම හා ඒවා යාවත්කාලීන කිරීම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මේ වනවිට අදාළ වර්ගීකරණයට අයත් ලේඛන යාවත්කාලීන කර ඇත. | කාර්ය සංග්‍රහය ප්‍රකාරව ප්‍රමුඛතා 1, 2, 3 ලෙස වර්ගීකරණය කර ඒ යටතේ ලේඛන පවත්වාගෙන යාම හා ඒවා යාවත්කාලීන කිරීම කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 189 | 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වෙළඳ ණයගැතියන්ගෙන් ලැබුණු රු.2,574,468 ක් වටිනා චෙක්පත් 38 ක් අගරු වී තිබුණද එකී වටිනාකම නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ණය ගැතියන්ගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරන ලෙස අදාළ අංශ වෙත දැනුම් දී ඇත. | අගරු චෙක්පත් වල වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති රජය සතු ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 3.2. V ඡේදය | දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සෑම විටම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කළ යුතු වුවද කාර්යාංශය එසේ අනුමත දිරිදීමනා යෝජනා ක්‍රමයක් නොමැතිව සමාලෝචිත වර්ෂය තුළ රු.107,000,000 ක දිරිදීමනා ගෙවා තිබුණි. | කාර්යාංශය දිරිදීමනා ගෙවීම සඳහා නව ක්‍රමවේදයක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ අනුව මෙම නව ක්‍රමවේදය සඳහා අනුමැතිය ලැබීමෙන් අනතුරුව, 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, දිරිදීමනා ක්‍රමය ක්‍රියාත්මක කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,969,642,374 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.1,564,466,354 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.405,176,020 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පරිපාලන පිරිවැය හා ආදායම් බදු වියදම පිළිවෙලින් රු.571,352,480 කින් හා රු.159,270,375 කින් වැඩිවුවද මෙහෙයුම් පිරිවැය රු.159,905,428 කින් අඩුවීම, ආදායම හා මූල්‍ය ආදායම පිළිවෙලින් රු.743,932,869 කින් හා රු.219,693,368 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාශය විසින් ඉන්ධන ටැංකියක් මිලදී ගෙන කාර්යාංශ පරිශ්‍රයේ ඉන්ධන ගබඩා කරන ස්ථානය සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.4,401,262 ක් වැය කර තිබුණු අතර 2023 මැයි 31 දින විටත් මෙම වත්කම් උපයෝජනය කර නොතිබුණි. | රුපියල් ගිණුම් විවෘත නොකිරීම හේතුවෙන් කාර්යාංශයට සෘජුවම සංස්ථාව හරහා ඉන්ධන ලබා ගැනීම ප්‍රමාද විය. එහෙත් මේ වන විට සංස්ථාව කාර්යාංශයට රුපියල් ගිණුම් හරහා සාමාන්‍ය වෙළඳපොළ මිලටම තෙල් ලබා දීමට එකඟතාව පල කර ඇති බැවින් ඉදිරියේදී කාර්යාංශය මෙම ටැංකිය අවශ්‍ය කටයුතු සඳහා උපයෝජනය කර ගනු ඇත. | වත්කම උපයෝජනය කළ යුතුය. අත්‍යවශ්‍ය නොවන මිල දී ගැනීම්වලින් වැලකී සිටිය යුතුය. |

## 3.2 කළමනාකරණය අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාංශයේ බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය සඳහා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල සඳහා ගිනි රක්ෂණ ආවරණයක් ලබා නොගැනීම හේතුවෙන් එම ගොඩනැගිල්ලට සිදුවූ ගිනි හානිය පූර්ණය කිරීම සඳහා ගොඩනැගිලි හිමියාට 2022 මාර්තු 29 දින රු.2,120,713 ක වන්දියක් ගෙවීමට සිදුවී තිබුණි. කාර්යාංශය විසින් ඊට අදාළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණනය දක්වා ඇති පරිදි අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ඇත. | වගකීම පැහැර හළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | කළුගල් සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේදී, කාර්යාංශය විසින් කැණීම්කරු වෙතින් ආර්ථික ජීව්‍යතා වාර්තා ලබාගෙන තිබුණු අතර කළුගල් කැණීම් කිරීමෙන් අනතුරුව බිම් මට්ටම අවට තැනිතලාවල සාමාන්‍ය බිම් මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතින බැවින් ගොඩකිරීමේ අවශ්‍යතාවයක් මතු නොවන බවත් ඉවත් කරන ලද ඉහළ පස් අතුරා භූමිය පුනරුත්ථාපනය කිරීමෙන් පසු වගාවන් සඳහා හා වෙනත් සුදුසු කටයුතු සඳහා භූමිය භාවිත කළ හැකි බවත් දැක්වෙන ප්‍රකාශනයක් ඒවායේ ඇතුළත් කර තිබුණි. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 52(2) වගන්තිය ප්‍රකාරව කැණීම් වලින් අනතුරුව භූමිය පුනරුත්ථාපනය කළ යුතු වුවද උක්ත ප්‍රකාශනය මත පදනම්ව කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේදී භූමි පුනරුත්ථාපනය සඳහා බැංකු ඇපකර ලබාගෙන නොතිබුණි. | කාර්යාංශය විසින් කැණීම් භූමි පුනරුත්තාපනය සම්බන්ධව පුනරුත්ථාපන සැලැස්මක් ලබා ගෙන එම සැලැස්මෙහි යෝග්‍යතාවට ගැලපෙන ලෙස පුනරුත්ථාපන බැඳුම්කර ලබා ගෙන කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් වර්තමානයේ හඳුන්වා දී ඇත. | භූමි පුනරුත්ථාපනය සම්බන්ධයෙන් සුදුසු පරිදි බලපත්‍රවලට කොන්දේසි ඇතුළත් කිරීමට හා ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කළුගල් කැණීම් සිදුකිරීමේදී පවත්නා පොළොව මට්ටමෙන් අභ්‍යන්තරයට කැණීම් සිදු නොකළ යුතු බවට බලපත්‍ර කොන්දේසි තුළ දක්වා තිබුණි. එසේ වුවද කළුගල් කැණීම් ස්ථාන බොහෝමයක් භූමි මට්ටමට වඩා පහතට කැණීම් කිරීමෙන් සෑදුනු වලවල් වල වතුර පිරී තිබුණු අතර අනතුරුදායක ලෙස අතහැර දමා තිබුණි. කාර්යාංශය එම වලවල් පුනරුත්ථානය කරවීමට හෝ කැණීම් බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | වතුර වලවල් තිබීමෙන් අනතුරු සිදු විය හැකි නිසා භූමි පරීක්ෂාවේදී හඳුනාගත් වලවල් සහිත ගල් වල වල් ආවරණය වන පරිදි සංවෘත කර අනවසර පුද්ගලයින්ට ගල්වල පරිශ්‍රයට ඇතුල් නොවීමට වග බලා ගන්නා ලෙස බලපත්‍රලාභීන්ට දැනුම්දීමට කාර්යාංශය විසින් පියවර ගෙන ඇත. | බලපත්‍ර කොන්දේසි කඩකළ බලපත්‍රලාභීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා කැණීම් භූමි පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බලපත්‍රලාභින් විසින් පුනරුත්ථාපනය කරන ලද සහ නොකරන ලද කැණීම් භූමි හඳුනාගත හැකිවන පරිදි හා ලබාගෙන ඇති බැඳුම්කර සම්බන්ධ තොරතුරු දැක්වෙන පරිදි දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | දත්ත පද්ධති තුළ කැණීම් භූමි වල පුනරුත්ථාපනය කිරීම සහ නොකිරීම සම්බන්ධ තොරතුරු නිරූපණය නොවන අතර බැඳුම්කර තබා ඇති ලිපිගොනුවල සමස්තය ද නිරූපණය නොවේ. | කැණීම් භූමි වලට අදාළ සියලු තොරතුරු ඇතුළත්ව දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. |
| (ඉ) | දඹුල්ල ප්‍රදේශයේ පෞද්ගලික සමාගමක් විසින් "සර්කෝන් මීඩ්ලින්" ඛනිජ වැලි මෙ.ටො. 416 ක් අපනයනය කිරීම සඳහා එම ඛනිජ වල අන්තර්ගත විකිරණශීලී මට්ටම පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත භාර දී තිබුණි. එම නියැදි වල පැවති විකිරණශීලීතාවය ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය මගින් නියම කර ඇති ප්‍රවාහනයේදී පැවතිය යුතු අනුමත විකිරණශීලීතාවය ඉක්මවා තිබුණි. එසේ වුවද ඛනිජවල අන්තර්ගත විකිරණශීලීත්වයේ ප්‍රමාණික සංයුතිය සලකා බැලීමකින් තොරව හා ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාව වෙතින් අනුමැතිය ලබා ගැනීමකින් තොරව මේ සඳහා සමාගම වෙත අපනයන | මෙම ගැටලුව විසඳීමට මේ වන විට කාර්යාංශය ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, 2023.03.20 දිනැතිව අධ්‍යක්ෂ ජනරාල් අංක DG.Mining/In.Memo/2023/02 දරන මැමය නිකුත් කොට ඇත. | ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාව වෙතින් ඛනිජ වල අන්තර්ගත විකිරණශීලී මට්ටම පරීක්ෂා කර අනුමැතිය ලබාදුන් පසුව බලපත්‍ර නිකුත් කළ යුතුය. වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බලපත්‍ර 2 ක් කාර්යාංශය විසින් නිකුත් කර තිබුණි. | | |
| (ඊ) | මන්නාරම් දූපතෙහි ඛනිජ වැලි ගවේෂණය සඳහා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගම් 05 කටද, මිනිරන් ගවේෂණ බලපත්‍ර 09 ක් සමාගම් 04 කටද, නිකුත් කර තිබුණි. මෙම සමාගම් විසින් වසර 10 -13 දක්වා කාලයක සිට කාල දීර්ඝයන් සහිතව ගවේෂණය කර තිබුණද නව මිනිරන් පතල් හා ඛණිජ වැලි ප්‍රදේශ සමාලෝචිත වර්ෂය දක්වා සොයා ගෙන නොතිබුණි. ගවේෂණ බලපත්‍ර ලබාගන්නා බලපත්‍රලාභීන් කිසිදු ඛනිජ ගවේෂණයක් සිදු නොකර අදාළ ප්‍රදේශය වෙන් කර ගෙන සිටින බැවින් ඛනිජ ගවේෂණ ව්‍යාපෘතිවල යෙදීමට අපේක්ෂාවෙන් සිටින අනෙකුත් දේශීය හා විදේශීය ආයෝජකයන්ට අවස්ථා සීමිත වී තිබුණි. | මෙම බලපත්‍ර පහේම ගවේෂණ කටයුතු 2022 වසරේ අවසන් කරනු ලැබූ අතර, කාර්යාංශය විසින් අදාළ අවසන් ගවේෂණ වාර්තා ඇගයීම සිදු කරන ලදි. මෙම ව්‍යාපෘති කැණීම් සඳහා ආර්ථික වශයෙන් ඵලදායී ව්‍යාපෘති ලෙස හඳුනා ගන්නා ලද බැවින්, අදාළ බලපත්‍රලාභීන්ට කැණීම් සඳහා අයදුම් කරන ලෙස දන්වා ඇති අතර, තවදුරටත් ගවේෂණ දීර්ඝ කිරීම සිදු නොවේ. | ගවේෂණ බලපත්‍ර ලබාදුන් පසුව ගවේෂණ ප්‍රගතිය හා ඉදිරි සැලසුම් පරීක්ෂා කරමින් බලපත්‍ර කාලය දීර්ඝ කළ යුතු අතර ප්‍රගතියක් වාර්තා නොකරන්නේ නම් බලපත්‍ර අවලංගු කළ යුතුය. |
| (උ) | කාර්යාංශයේ සාමාන්‍ය කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියෙන් බැහැරව කළුගල්, පස්, වැලි, බොරළු, මැටි යන ඛනිජ ඉවත් කිරීම සඳහා “කැණීමක් නොවන ක්‍රියාවලි මගින් ජනිත වන ඛනිජ ඉවත් කිරීම සඳහා නිකුත් කරනු ලබන විශේෂ අවසර පත්‍ර” 1226 ක් සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කර තිබුණි. මෙම බලපත්‍ර නිකුත් කිරීමේදී 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 30 සහ 31 වගන්ති ප්‍රකාරව බලපත්‍ර නිකුත් කිරීමේ බලතල සම්බන්ධයෙන් සීමා කිරීම් හා බලපත්‍ර කිසිවක් නිකුත් කරනු නොලැබිය යුතු ප්‍රදේශ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | විශේෂ අවසරපත්‍ර ඉතාමත් සීමිත වූ ප්‍රමාණයක් පමණක් නිකුත් කරනු ලබන අතර, ඒ සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇත. | සාමාන්‍ය කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියෙන් බැහැරව කැණීම් බලපත්‍ර නිකුත් කරන්නේ නම් ඒ සඳහා කළමනාකරණ මණ්ඩලය අනුමත කළ නිශ්චිත ක්‍රමවේදයක් ප්‍රකාශයට පත්කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) | කාර්යාංශයට ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කර ගැනීම සඳහා 2022 නොවැම්බර් 17 දින රු.128,736 ක වියදමක් දරා පුවත්පත් දැන්වීමක් පලකර තෝරාගත් උපදේශන ආයතනය වන මොරටුව විශ්ව විද්‍යාලයට | ERP පද්ධතිය ස්ථාපනයට අදාළ මූලික ලේඛන තුළ යම් විෂයයන් මගහැරී තිබූ බවට පසුව අනාවරණය වූයෙන් අනුගමනය කළ | ලංසු ලේඛන පිළියෙල කිරීමේදී හා ඇගයීමේදී ආයතනයේ අවශ්‍යතාවයන් නියමිත පරිදි ඇතුළත්ව තිබේද යන්න තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් |

| | | |
|---|---|---|
| රු.1,125,000 ගෙවා මූලික ලංසු ලේඛන හා අනෙකුත් ලේඛන සැකසීම සඳහා උපදේශන සේවා ලබාගෙන තිබුණි. මෙම ලංසු ලේඛන වෙනුවට නව ලංසු ලේඛන සකස් කිරීමට 2023 පෙබරවාරි පැවති තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීමේදී තීරණය කර තිබීම හේතුවෙන් අදාළ කාර්ය සඳහා දරා තිබුණු එකතුව රු.1,253,736 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තාවකාලිකව නතර කිරීමට සිදු විය.<br>මේ වන විට සියලු අංශ වල විෂය පථයන් ආවරණය කර නැවත අවශ්‍යතා සංක්ෂිප්ත කරමින් පවතී. මෙම ක්‍රියාවලියෙන් පසුව ලංසු ලේඛන සකසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට කටයුතු කර ඇත. | සලකා බලා නිෂ්කාර්ය වියදම් අවම කිරීමට කටයුතු කළ යුතුය. නිෂ්කාර්ය වියදමක් ඇති වීමට ක්‍රියා කළ වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 12 වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකාවෙහි ක්‍රමවත් භූ විද්‍යා සිතියම් සැකසීම භාර ගැනීම සහ භූ විද්‍යා සිතියම් සකස් කිරීම, ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනා ගැනීම සහ ඒවා තක්සේරු කිරීම කාර්යාංශයේ කාර්යයන් විය. ඊට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සම්බන්ධ කාර්යසාධනය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (i) චාතුර්ථික සිතියම් වැඩසටහන යටතේ විල්පත්තු කලාපයේ සිතියම්කරණ ක්ෂේත්‍ර කටයුතු වලින් සියයට 75 ක් 2015 වර්ෂයේ සම්පූර්ණ කර තිබුණු බැවින් ඉටුකළ යුතුව පැවති ඊට අදාළ සිතියම්කරණ කටයුතු ද පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි කටයුතු ද කතරගම - යාල සහ | චාතුර්ථික භූ විද්‍යා සිතියම් වැඩසටහන අවසාන අදියරේ පවතී.<br>මෙම කතරගම - යාල න්‍යෂ්ඨික අමුද්‍රව්‍ය සමීක්ෂණය සම්පූර්ණයෙන් අතහැරීමට යෝජනා විය.<br>භූ රසායනික සිතියම්කරණය ශ්‍රී ලංකාව තුළ මෑතක දී ආරම්භ කළ ව්‍යාපෘතියක් හෙයින් කාලයක් අවශ්‍ය විය. | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කළ යුතු අතර සැලසුම් කළ කාර්යභාරයන් නියමිත කාලය තුළ නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මන්නාරම -කිරින්ද ප්‍රදේශයන්හි සිදුකරන න්‍යෂ්ටික අමුද්‍රව්‍ය සමීක්ෂණයන්හි කටයුතු ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. | | |
| (ii) | ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක සිතියම සම්පාදනය සහ මුද්‍රණය කිරීමත්, 2015 වර්ෂයේ අවසන් කර තිබුණු 1:50,000 චාතුර්ථීක සිතියම්කරණය යටතේ අංක 29 කල්පිටිය සිතියම මුද්‍රණය කිරීමත් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසය වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණු අතර වර්ෂය අවසාන වන විට සිතියම සම්පාදනය කර තිබුණද මුද්‍රණ කටයුතු අවසන් කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක සිතියම මේ වන විට මුද්‍රණය කර ඇත. කල්පිටිය හා විල්පත්තු සිතියම් 2022 වසරේදී සම්පාදනය අවසන් කොට තිබුණු අතර, මුද්‍රණ කටයුතු 2023 වසරේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ. | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කළ යුතු අතර සැලසුම් කළ කාර්යභාරයන් නියමිත කාලය තුළ නිම කළ යුතුය. |
| (iii) | වවුනියා-ත්‍රිකුණාමලය අංක 6 පාංශු භූ රසායනික සිතියම සමාලෝචිත වර්ෂයේ මාර්තු අවසානය වන විට මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණද වර්ෂය අවසානය වන විටත් මුද්‍රණය කර නොතිබුණි. | භූ රසායනික සිතියම්කරණය ශ්‍රී ලංකාව තුළ මෑතක දී ආරම්භ කළ ව්‍යාපෘතියක් හෙයින් කාලයක් අවශ්‍ය විය. | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කළ යුතු අතර සැලසුම් කළ කාර්යභාරයන් නියමිත කාලය තුළ නිම කළ යුතුය. |
| (iv) | දකුණු පළාත් ඛනිජ සිතියම සම්පාදනය සහ මුද්‍රණය සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද සම්පාදන කටයුතු පමණක් නිම කර තිබුණි. | දකුණු පළාත් ඛණිජ සිතියම මේ වන විට මුද්‍රණය කර ඇත. | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කළ යුතු අතර සැලසුම් කළ කාර්යභාරයන් නියමිත කාලය තුළ නිම කළ යුතුය. |
| (v) | නැගෙනහිර පළාත් ඛනිජ සිතියම සඳහා ක්ෂේත්‍ර රාජකාරී, සිතියම් සම්පාදනය හා මුද්‍රණ කටයුතු සමාලෝචිත | නැගෙනහිර පළාත් ඛණිජ සිතියම 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුනද රටේ එවකට පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් | ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කළ යුතු අතර සැලසුම් කළ කාර්යභාරයන් |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ ඔක්තෝබර් වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද අදාළ කාර්යයන් වර්ෂය අවසානය වන විටත් ආරම්භ කර නොතිබුණි. | 2023 වසරට කල් දමන ලදී. එමෙන්ම ආයතනයේ සේවයේ නියුතුව සිටි විද්‍යාඥයින් විශාල පිරිසක් මේ වනවිට රැකියාවෙන් ඉවත්ව විදේශ ගතවීම ද භූ විද්‍යා අංශය මගින් සිදුකිරීමට නියමිත කාර්යයන් ප්‍රමාද වීමට හේතු වී ඇත. | නියමිත කාලය තුළ නිම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ 2021 හා 2022 වර්ෂ සඳහා ඛනිජ අත්පොත්(Mineral Year Book) ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කර තිබුණද එය ඉටුකර නොතිබුණු අතර 2020 වර්ෂයේ ඛනිජ අත්පොත ප්‍රමාද වී 2023 මැයි 13 දිනදී ප්‍රකාශයට පත්කර තිබුණි. | වාර්ෂික ඛනිජ අත්පොත ප්‍රකාශයට පත් කිරීම සඳහා කාර්යාංශය තුළ දත්ත මෙන්ම ඛනිජ සම්බන්ධ ව්‍යාපාරවල යෙදී සිටින්නන්ගෙන්ද වෙනත් රාජ්‍ය ආයතන වලින් ද දත්ත ලබාගනු ලැබේ. එහෙත් බොහෝ විට මෙම සමාගම් අදාළ දත්ත නිසි වෙලාවට ලබා නොදීම මෙන්ම ශ්‍රී ලංකා රේගුව වැනි ආයතන එම දත්ත ලබාදීම සඳහා මුදල් අයකිරීම හේතුවෙන් නිසි වේලාවට මෙම ඛනිජ අත්පොත එළිදැක්වීමට නොහැකි විය. | 2021 හා 2022 ඛනිජ අත්පොත් නොපමාව ප්‍රකාශයට පත්කළ යුතුය. |